# සත්‍යය පිළිබඳ බෞද්ධ සංකල්පය

ඇකිරියගල නන්ද හිමි

සත්‍ය හෙවත් සච්ච ශබ්දය අර්ථ නවයක යෙදෙන බව අභිධානප්පදිපිකා පාලි නිඝණ්ඩුවේ සඳහන් කර ඇත. නිර්වාණය, ආර්ය මාර්ගය, විරත, ශපථ, සත්‍ය වචන, අවිපරීත, ආර්ය සත්‍ය, දෘෂ්ටි සත්‍ය වශයෙනි.[1] සූත්‍ර පිටකය ඇසුරෙන් බුදුදහමෙහි දාර්ශනික ප්‍රස්තුත පිළිබඳ විමසීමක යෙදෙන ඉත්තෑපාන ධම්මාලංකාර හිමියෝ සත්‍යය සම්බන්ධයෙන් මෙසේ සඳහන් කරති.[2] පැවැත්ම අර්ථවත් සත් ධාතුවෙන් ''සත්‍ය'' සංකල්පය ජනිත වී ඇත. ''යමක් ඇත්ත වශයෙන්ම පවතී ද'' එය සත්‍ය නම්. මේ වනාහි සත්‍යය පිළිබඳ පදගත වූ අර්ථය වෙයි. දර්ශන ක්ෂේත්‍රයෙහි ලා එය වැඩිදුර අර්ථ විකාශයට පාත්‍ර වී ඇත. ඒ බව ''ඒකං සද් විප්‍රා බහුධා වදන්ති'' පරමාර්ථ වශයෙන් ප්‍රවතීමාන වන දෙය එකෙකි. එහෙත් විප්‍රයෝ එය නන් අයුරින් ප්‍රකාශ කරති. (ඍග්-1.164.46) යන ප්‍රස්තුතයෙන් පෙනී යයි. මෙහිලා ඉගැන්වෙන සත්‍යය හෙවත් සද්භාවය පාරභෞතික සද්භාවයකි. මේ සත්‍ය සංකල්පය උපනිෂද් දර්ශන ඔස්සේ දියුණු වී ගිය අයුරු භාරතීය චින්තා ඉතිහාසයෙන් පෙනී යයි. සත්‍යය සංකල්පය උපස්ථාපනය කළ වෛදික චින්තාවන්ගෙන් ඒ පිළිබඳ ව පැවසෙන තොරතුරු ගූඪ ස්වරූපයක් ගනී. මින් පසුව ඇති වූ විශිෂ්ට දර්ශනයක් වූ සාංඛ්‍ය චින්තාවේ ද සත්‍ය ගැන සිත් යොමු කර ඇත. ප්‍රාථමික වශයෙන් පාරභෞතික පරිණාමවාදයක් වූ එහිදු සත්‍යය පිළිබඳ පැවසෙන කරුණු සීමාසහිත වූයේ වෙයි. දුර බව, ළං බව, ඉන්ද්‍රිය දුර්වලභාවය,

මනසේ කැළඹීම වැනි කරුණු නිසා සත්‍යය වූ ප්‍රත්‍යක්‍ෂයන් ඇති නොවන බව සාංඛ්‍ය දර්ශනය පවස යි. සාංඛ්‍ය දර්ශනයේ පරමාර්ථය පාරභෞතික සංකල්පයක් වූ "ප්‍රකෘතිය" තමාට අයත් නො වූ දෙයක් බව ප්‍රත්‍යක්ෂ කරවීම යි. එය ද පාරභෞතික ක්‍රියා මාර්ගයකි. මින් පැහැදිලි වනුයේ බුදුරජාණන් වහන්සේ පහළ වූ භාරතීය ආගමික හා දාර්ශනික ක්‍ෂේත්‍රය තුළ සත්‍යය සම්බන්දයෙන් පැහැදිලි අර්ථකථනයක් ඉදිරිපත් වී නොතිබුණු බවකි.

භාරතයේ පහළ වූ අසමසම දහමක් වූ බුදුදහම සත්‍යය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ඉගැන්වීම ආචාර විද්‍යාත්මක වූත්, ඥාන විභාගීය වූත්, ආධ්‍යාත්මික වූත් ලක්‍ෂණයන්ගෙන් යුක්ත වූවක් බව සූත්‍රගත කරුණු අධ්‍යයන කිරීමේ දී ප්‍රකට වෙයි.

සිද්ධාර්ථ ගෞතම බෝධිසත්වයන් වහන්සේ ''සම්මා සම්බුද්ධ'' තත්ත්වයට පත් වූයේ සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථාභූතය, ඇත්ත, ඇතිසැටිය නුවණින් දැක අවබෝධ කිරීමෙනි. (යථාභූත, ඤාණදස්සන) එබැවින් බුදුදහමෙහි පදනම සත්‍ය වේ. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව වශයෙන් පිළිගනු ලබන ''දම්සක් පැවතුම්'' සූත්‍රයේ අවබෝධ කළ සත්‍යය කොටස් හතරකින් යුක්ත බව සඳහන් වෙයි.[4]

i. දුක්ඛ අරිය සච්ච
ii. දුක්ඛ සමුදය අරිය සච්ච
iii. දුක්ඛ නිරෝධ අරිය සච්ච
iv. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා අරිය සච්ච යනුවෙනි.

මේ එක් එක් ආර්ය සත්‍යයක් සම්බන්ධයෙන් කළ යුතු කාර්යයන් ද ඇත. දුක්ඛ ආර්ය සත්‍ය පරිඤ්ඤෙය්‍ය වූවකි; එනම් දුක යනු කවරේදැ යි මැනවින් පිරිසිඳ දත යුතු වේ. දුක්ඛ සමුදය ආර්ය සත්‍ය අත් හළ යුතු වේ. එනම් මෙය පහාතබ්බ වේ. දුක්ඛ නිරෝධ සත්‍යය නුවණින් සාක්‍ෂාත් කළ යුතුය; එනම් සච්ඡිකාතබ්බ වේ. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය වැඩිය යුතු වේ; එනම් භාවෙතබ්බ වේ. මේ එක් එක් ආර්ය



සත්‍යක් සම්බන්ධයෙන් කළ යුතු කාර්යයන් ද අවස්ථා තුනකින් යුක්ත බව සඳහන් කර ඇත. සච්චඤාණ, කිච්චඤාණ, කතඤාණ යනුවෙනි. සත්‍යය බව දැන ගන්නා නුවණ, සත්‍යය බව දැන ගනු සඳහා කළ යුතු දේ දන්නා නුවණ, කළ යුතු දේ කර අවසන් බව දන්නා නුවණ යනු ඒ ත්‍රිකය යි.

බුදුරජාණන් වහන්සේ මේ සත්‍ය සතර ගැන සඳහන් කිරීමේ දී 'අරිය' යන විශේෂ ගුණවාචක පදයකින් හඳුන්වා ඇත. එසේ විශේෂ කොට විශේෂ ජාතියේ සත්‍ය සතරක් වශයෙන් හැඳින්වූයේ කුමක් නිසා ද යන්න ප්‍රකට නැත. එහෙත් බුද්ධඝෝෂ ආචාර්යපාදයන් 'අරිය' යන ගුණවාචක පදය යෙදීමට හේතු විසුද්ධිමග්ගයේ සඳහන් කර ඇත. උන්වහන්සේ මෙහිලා සාධක හතරක් ඉදිරිපත් කරති.[4]

i. බුද්ධාදී ආයර්‍යන් වහන්සේලා විසින් ම මේ සත්‍ය සතර පිරිසිඳ දන්නා නිසා,
ii. ආයර්‍යන් වහන්සේලාට ම අයත් වන නිසා,
iii. මේ සත්‍යය අවබෝධයෙන් ම කෙනෙක් ආයර්‍ය හෝ අරිය තත්ත්වයට පත් වන නිසා,
iv. මෙම සත්‍යය විශිෂ්ට, ආයර්‍ය වන නිසා ම අරිය සච්ච වන බව.[6]

මෙම අදහස් ඉදිරිපත් කිරීමේ දී සාක්‍ෂි වශයෙන් බුද්ධ වචනය උපයෝගී කරගෙන ඇති බව ද අවධානයට ගත යුතු වේ.

බුදුරජාණන් වහන්සේ චතුරාර්‍ය චතුරාර්‍ය සත්‍යය පිළිබඳ ව සඳහන් කරමින් එය තථ, අවිතථ, අනඤ්ඤථ යන ලක්‍ෂණයන්ගෙන් ද යුක්ත බව සූත්‍රාන්තයන්හි දී වදාරා ඇත.[6]

අවිතථ යනු සත්‍යය බව යි, අවිතථ යනු අසත්‍ය නොවන බව යි. අනඤ්ඤථ යනු වෙනස් තත්ත්වයකට පත් නො වන බව යි. අවිහිංසාවා දී බව යි. පටිච්චසමුප්පාද ධර්මය ගැන සඳහන් කිරීමේ දී ද උක්ත වචනවලින් එය හඳුන්වා දී ඇත.[7] සූත්‍රාන්තයන්හි අරියසච්ච යන්න චතුරාර්‍ය සත්‍ය සම්බන්ධයෙන් භාවිතා කළ ද, හුදෙක් 'සච්ච' යන්නෙන් ආයර්‍ය සත්‍ය සතර

පමණක් නො ව වෙනත් සත්‍යයන් ද අදහස් කෙරෙන බව විශුද්ධි මාර්ගයෙහි සඳහන් කර ඇත.[9]

i. වාචා සච්ච
ii. විරති සච්ච
iii. දිට්ඨි සච්ච
iv. මග්ග සච්ච (පරමත්ථ සච්ච, නිබ්බාන)
v. අරිය සච්ච

බුද්ධඝෝෂ ආචාර්යපාදයන් මෙම අර්ථයන්හි සච්ච ශබ්දය යෙදෙන ස්ථාන සූත්‍ර ධර්මයන්හි උදාහරණ වශයෙන් උපුටා දක්වන බැවින් සච්ච ශබ්දය විවිධ අරුත්හි වැටෙන බව ප්‍රකට වෙයි. සච්ච ශබ්දය විවිධ සන්දර්භ යටතේ විවිධ අර්ථ ගන්නා බව ද මින් පෙන්නුම් කරයි.

සත්‍යය පිළිබඳ සාකච්ඡා කරමින් බුද්ධඝෝෂ ආචාර්යපාදයන් විසින් ඉදිරිපත් කරනු ලබන වාචා සච්ච යන්නෙහි වාචික ප්‍රකාශයන් පිළිබඳ ස්වභාවයත්, ආධ්‍යාත්මික වශයෙන් ඒ සම්බන්ධයෙන් ඇති කර ගනු ලබන අවබෝධයත් අතර ඇති විශිෂ්ඨ බව කෙබඳු දැයි පැහැදිලි කර ගත යුතු වේ. නිර්වාණගාමී ප්‍රතිපදාව ත්‍රිශික්ෂාව යි. එහි ප්‍රථමය සීලය යි. සීල ශික්ෂාව තුළ සත්‍ය වචන කතා කිරීමටත්, අසත්‍යයෙන් වෙන්වීමටත් ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. ගිහි බෞද්ධයාගේ නිත්‍ය ශීලය පඤ්ච සීලය යි. එහි සිව්වන සික පදය මුසාවාද විරමණය යි. සූත්‍ර ධර්මයන්හි මුසාවාද විරමණයේ ලක්ෂණ කවරේදැ යි විස්තර කර ඇත.[9] ''මුසාවාදං පහාය මුසාවාද පටිවිරතො හොති සච්චවාදී, සච්ච සන්ධො, ථේතො පච්චයිකො අවිසංවාදකොලොකස්ස ඉදම්පිස්ස හොති සීලස්මිං'' හේ බොරු කීම දුරලා, බොරු කීමෙන් වැළැක්කේ වෙයි. ඇත්ත කියන සුලු වූයේ, ඇත්තෙන් ඇත්ත ගලපා කියන්නේ, තහවුරුවැ පිහිටි කථා ඇත්තේ, ඇදහිය යුතු කතා ඇත්තේ, ලොව නො රවටන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයක් වේ. පුද්ගලයෙකුගේ වාචික විනය, වාචික හික්මීම, සංවරය යනු උක්ත ආකාරයෙන් වචන පාවිච්චි කිරීම යි. සත්‍ය ගරුක වීම යි.

16 OCT 2017



සත්‍ය පිළිබඳ බෞද්ධ න්‍යායෙහි සත්‍ය අවබෝධයට ප්‍රධාන තැනක් හිමි වේ. එය ඉතා වැදගත් කොට සැළකේ. මිනිස් ජීවිතය සම්බන්ධයෙන් දුක යනුවෙන් කතා කරන්නේ අනිවාර්යයෙන් ම ජීවිතය පිළිබඳ ව දත යුතු වූ සත්‍යය යි. එය පරිඤ්ඤෙය්‍ය යි. මුලින් සඳහන් කළාක් මෙන් බුදුදහමෙහි පරම සත්‍ය ක්ෂාත්සාත් කරණයේ දී එය පිරිසිඳ දැනීම, අත්හැරීම, ක්ෂාත්සාත්කරණය, පිළිවෙත වැඩීම යන අංශ හතරෙන් ම සම්පූර්ණ විය යුතු වේ. භාවේතබ්බ නමින් හැඳින්වෙන සිව්වැනි ආර්ය සත්‍ය ආධ්‍යාත්මික වූ ද, සදාචාරාත්මක වූ ද ක්‍රියා පිළිවෙළකි. ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි සම්මා වාචා නමින් හැඳින්වෙන තෙවැනි අංගයේ දී පුද්ගලයා මුසාවාදයෙන් පමණක් වෙන් ව සිටීම ප්‍රමාණවත් නො වේ. සත්‍යය කතා කිරීම ම සෑහෙන්නේ නැත. චතුර්විධ වාග් දුස්චරිතයෙන් ම වෙන් විය යුතු වේ. පිසුණා වාචා වේරමණී, ඵරුසා වාචා වේරමණී, සම්පප්ඵලාපා වේරමණී යන්නෙන් ඒ බව දැක්වෙ යි. හරියට ම සත්‍යය කතා කරන්නෙක්, සත්‍යයට ගරු කරන්නෙක් වීමට උක්ත සතර වැදෑරුම් දෝෂයන්ගෙන් විනිර්මුක්ත වචන ඔහු භාවිත කළ යුතු වේ.

සත්‍යය පිළිබඳ බෞද්ධ ආකල්පය සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනයක දී මජ්ඣිම නිකායේ ඇතුළත් අභයරාජකුමාරය සූත්‍රයත්, චංකී සූත්‍රයත් පුළුල් ව සාකච්ඡා කළ යුතු වේ. අභයරාජකුමාර සූත්‍රයේ ඇතුළත් සත්‍යය ප්‍රකාශ කිරීම පිළිබඳ අදහස විමසීමේ දී මේ සම්බන්ධයෙන් මහාචාර්ය කේ. ඇන්. ජයතිලක මහතා 'මුල් බුදුසමයේ ඥාන විභාගය' නම් ග්‍රන්ථයෙහි කර ඇති විග්‍රහය අමතක කළ නොහේ.[10] බුදුරජාණන්වහන්සේගෙන් නිගණ්ඨ ශ්‍රාවකයකු වූ අභය රාජකුමාරයා අසන ලද ප්‍රිය, අප්‍රිය වචන කතා කිරීම සම්බන්ධයෙන් නගන ලද පැනයකට පිළිතුරු වශයෙන් මෙම සූත්‍රය දේශනා කර ඇත. කෙනෙක් කරන ප්‍රකාශනයන් ඒවායේ සත්‍යයතා ඇගයීම, ප්‍රයෝජනවත් බව, නිශ්ප්‍රයෝජනවත් බව, ප්‍රසන්න අප්‍රසන්න බව යන ආකාරයෙන් වර්ග කෙරෙන ආකාරයක් මෙම සූත්‍රයෙහි හමු වෙයි. මෙම සූත්‍රයෙහි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනු ලබන්නේ කවර

ලක්ෂණයන්ගෙන් යුක්ත ප්‍රස්තුත ද යන්න හෙළි කරයි. සත්‍යය විය හැකි (භූතං තච්චං) හෝ අසත්‍යය විය හැකි (අභූතං අතච්චං) ප්‍රයෝජනවත් (අත්ථසංහිතං) හෝ නිෂ්ප්‍රයෝජන (අනත්ථසංහිතං) අන් අයට ප්‍රසන්න (පරෙසං පියාමනාපා) හෝ අප්‍රසන්න (පරෙසංඅප්පියා අමනාපා) යනාදි කවරක් වූවත් ඒ අනුව අට වැදෑරුම් ආකාරයක් අභයරාජකුමාර සූත්‍රයෙහි දැකිය හැකි ය. මහාචාර්ය ජයතිලක එය මෙසේ වර්ග කර දක්වයි.

| | | | |
|---|---|---|---|
| 1. | සත්‍යය | ප්‍රයෝජනවත් | ප්‍රසන්න |
| 2. | සත්‍යය | ප්‍රයෝජනවත් | අප්‍රසන්න |
| 3. | සත්‍යය | නිෂ්ප්‍රයෝජනවත් | ප්‍රසන්න |
| 4. | සත්‍යය | නිෂ්ප්‍රයෝජනවත් | අප්‍රසන්න |
| 5. | අසත්‍යය | ප්‍රයෝජනවත් | ප්‍රසන්න |
| 6. | අසත්‍යය | ප්‍රයෝජනවත් | අප්‍රසන්න |
| 7. | අසත්‍යය | නිෂ්ප්‍රයෝජනවත් | ප්‍රසන්න |
| 8. | අසත්‍යය | නිෂ්ප්‍රයෝජනවත් | අප්‍රසන්න |

මෙම ප්‍රස්තුත අට අභයරාජකුමාර සූත්‍රයේ මෙසේ සඳහන් වෙයි. ''රාජකුමාරයෙනි, තථාගතයෝ යම් වචනයක් 'අභූත' යැ 'අතථ්‍ය' යැ 'අනර්ථසංහිත' යැයි දනී ද, එද මෙරමා හට අප්‍රිය අමනාප වේ ද, තථාගතයෝ ඒ වචනය නො කියති. තථාගතයෝ යම් වචනකුත් භූත යැ, තථ්‍ය යැ, අර්ථසංහිත යැයි දනී ද, එද මෙර මා හට අප්‍රිය අමනාප වේ ද, එහි ලා තථාගතයෝ ඒ විවරණ කරන්නට කල් දන්නාහු වෙති. තථාගතයෝ යම් වචනයක් අභූත යැ, අත්‍ය යැ, අනර්ථසංහිත යැයි දනී ද, එද මෙර මාහට ප්‍රියමනාප වී ද, තථාගතයෝ ඒ වචනය නො වදාරති. තථාගතයෝ යම් වචනයකුත් භූත යැ, තථ්‍ය යැ, අර්ථසංහිත යැයි දනී ද, එද මෙර මා හට ප්‍රියමනාප වී ද, එහි ලා තථාගතයෝ ඒ විවරණ කරන්නට කල් දන්නාහු වෙති. ඒ කවර හෙයින් ද යත්, රාජකුමාරය, තථාගතයනට සත්ත්වයන් කෙරෙහි අනුකම්පා ඇති හෙයි.''[11]

උක්ත සූත්‍ර පාඨයට අනුව පැහැදිලි වන්නේ අන්‍යයන්ට ප්‍රසන්න වූවත් නැතත් සුදුසු අවස්ථාව එළඹි කල්හි සත්‍යය වූ ද



ප්‍රකාශ බුදුරජාණන් වහන්සේ විසින් කරනු ලබන බව ය. එහෙත් සුත්ත නිපාතයේ[12] ප්‍රකාශයක් කිරීමේ දී ප්‍රිය වචනය ම කතා කළ යුතු බව අවධාරණය කර ඇති බව ද සඳහන් කළ යුතු ය. ඒ අතර පුද්ගල හෝ සමාජ යහපත පිළිබඳ සැලකීමේ දී ඇතැම් විට අසන්නාට අප්‍රසන්න වූව ද අභිවෘද්ධිය ගැන සලකා අප්‍රසන්න ප්‍රකාශය ද කිරීමට සිදුවන බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙති. ළදරුවකුගේ උගුරේ හිර වී ඇති යමක් ඉවතට ඇද දැමීමේ දී ඔහුට වේදනාවක් වුවත්, කරන්නාට එය අප්‍රසන්න වුවත් දරුවාගේ දිවිගලවා ගැනීමට එය කළ යුතු වන්නාක් මෙන් යැයි සඳහන් කර ඇත. මෙසේ කරන්නේ තරහකින් නො ව දරුවා කෙරෙහි අනුකම්පාවෙනි. මේ පාඨයට අනුව බුදුසමයෙහි සත්‍යය පිළිබඳ බෞද්ධ සංකල්පය ඵලදායි වීම හා ප්‍රසන්න වීම සමග ද දැඩි සම්බන්ධයක් දක්වන බවක් පෙනෙ යි.

සත්‍යය පිළිබඳ බෞද්ධ ආකල්පය විමසීමේ දී චංකී සූත්‍රගත[13] අදහස් පරීක්‍ෂා කිරීම වැදගත් ය. සත්‍යය අවබෝධය ගැන සඳහන් කරමින් එහි අවස්ථා තුනක් තිබෙන බව බුදුරජාණන්වහන්සේ එහි දී සඳහන් කරති.

i. සච්චානුරක්ඛනා (සත්‍යය ආරක්‍ෂා කිරීම)
ii. සච්චානුබොධ (සත්‍යය සොයා ගැනීම, අනුබෝධය)
iii. සච්චානුප්පත්ති (සත්‍යය අවබෝධ කර ගැනීම)

යමෙක් සත්‍ය ආරක්‍ෂා කිරීමට කැමති නම්, සත්‍යය ආරක්‍ෂා කරන්නෙක් නම් ඔහු ක්‍රියා කළ යුත්තේ කෙසේදැ යි චංකී සූත්‍රයෙහි පෙන්වා දී තිබේ. ප්‍රථමයෙන් පුද්ගලයා 'ඉදං සච්චාභිනිවේසයෙන්' මිදුනු කෙනෙක් විය යුතු වේ. "භවත් ගෞතමයන් වහන්ස සත්‍යානුරක්ෂණය කෙසේ වේ ද? භාරද්වාජය මාගේ ඇදහිලි මෙසේය යි යම් පුරුෂයකුට ශ්‍රද්ධාව ඇති වේ නම්, එසේ කියා නම්, එය සත්‍යානුරක්ෂණය යි. එහෙත් එපමණකින් මෙය ම සත්‍යය, අනෙක හිස් යැයි, නිෂ්ඨාවට නො පැමිණෙ යි. එසේ ම රුචිය, අනුශ්‍රවය, පරිවිතර්කය, දිට්ඨිනිජ්ඣානක්ඛන්තිය යන මේ කවරක් නිසා හෝ මෙය මෙසේ යැයි තමා පිළිගන්නා බව ප්‍රකාශ කෙරේ නම් ඔහු සත්‍යය

රක්නේ ය. මෙය ම සත්‍යය, අනෙක් හිස් ය යන ඒකාංශික නිගමනයට ඔහු නො පැමිණායේ වෙයි. මෙසේ සත්‍යය ආරක්‍ෂා කරන්නේ වේ."[14]

සච්චානුබෝධය හෙවත්, අනාවරණය කර ගැනීම මෙපමණකින් සිදු නො වේ. ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල ද මෙම සූත්‍රයෙහි දැක්වෙ යි. "භවත් ගෞතමයන් වහන්ස සත්‍යානුබෝධය වන්නේ කෙසේ ද? භාරද්වාජය මේ සසුනෙහි පැවිදි වූවෙකු කරා කිසියම් කුල පුත්‍රයෙක් පැමිණ ලෝභ, දෝස, මෝහ යන තෙකරුණු පිළිබඳ මෙසේ විමස යි. යම්බඳු ලෝභ සිතැත්තෙක් තමන් නො දැන දනිමියි කියත් නො දැක දකිමියි කියාක් කිය යි. මෙසේ කියන කරන මහණෙක් පිරික්සීමේ දී එවැනි ගති ලක්‍ෂණයන්ගෙන් තොර අලෝභ, අදෝස, අමෝහ ගති ඇති කෙනෙකැ යි වටහා ගනී. කාය වාග් සමාචාර ඇත්තෙකැ යි වටහා ගනී. ඔහු දෙසන දහම ගැඹුරුය, දුකසේ දත යුතු ය, අවබෝධයට අපහසු ය, ශාන්තය, ප්‍රනීත යැ පණ්ඩිතයන් විසින් ම දත යුත්තේ ය යනුවෙන් ඒ මහණ පිළිබඳ ව ශ්‍රද්ධාවක් ඇති කරගෙන, ඔහු ඇසුරු කර දහම් අසා... පධන් වීර්යය වඩා නිවන් අවබෝධ කර ගනි යි. භාරද්වාජය මේ අප දක්වන සත්‍යානුබෝධය යි. (මෙයින් මාර්ගය කියැවේ.)[15]

තෙවැනි වූ 'සච්චානුප්පත්තිය' කෙසේ සිදුවේ ද? භාරද්වාජය ඉහත සඳහන් ධර්මයන් ආසේවනයෙන්, භාවනාවෙන්, බහුලීකරණයෙන්, නැවත නැවත වැඩීමෙන් සත්‍යානුප්‍රාප්තිය වෙයි. (මෙයින් මාර්ග ඵලය කියැවේ)[16] සත්‍ය සම්බන්ධයෙන් චංකී සූත්‍රය ඉදිරිපත් කරන අවස්ථා තුන තවදුරටත් පරීක්‍ෂා කළ යුතු වේ. ප්‍රථම පියවර වන "සච්චානුරක්ඛණ" අවස්ථාවේ දී දක්නට ලැබෙන්නේ හුදු වාචික ප්‍රකාශනයකි. එහි දී පුද්ගලයා සද්ධා, රුචි, අනුස්සව, ආකාරපරිවිතක්ක, දිට්ඨිනිජ්ඣා, නක්ඛන්ති යන පස් ආකාරයට අනුව ඉදං සච්චාභිනිවේසයෙන් තොර ව කිසියම් ප්‍රස්තුතයක් සම්බන්ධයෙන් මගේ විශ්වාසය මෙසේ ය. මගේ කැමැත්ත මේ ආකාරය, මා අසා දැනගෙන තිබෙන්නේ මේ විධියට ය. මා කළ තර්කයට අනුව මගේ අදහස මේ ආකාර යි. මා පිළිගත් දෘෂ්ටියට අනුව මගේ අදහස මේ



ආකාර යි, කියනවා විනා ඔහු ඒකාංශික නිගමනයක් හැටියට පරම සත්‍යයක් හැටියට ඉදිරිපත් නොකර යි. ඒ නිසා ඔහු සත්‍යය රකින සත්‍යයට ගරු කරන්නෙක් බවට පත්වේ. මෙය එක් අතකින් සරළ අවස්ථාවකි. දෙවැනි අදියර එනම් 'සච්චානුබෝධ' අවස්ථාව ඥානය සහ බුද්ධිමය ස්වභාවයක් ප්‍රකට කරයි. මෙහි දී පුද්ගලයා බුද්ධිමත් ව විමර්ශනශීලීව යම් යම් ප්‍රස්තුතයන් සම්බන්ධයෙන් පරීක්‍ෂා කර බලා එක්තරා ආකාරයක සන්‍තොෂණයකින් යුතුව ක්‍රියාකරමින් යමක් සත්‍යය සේ සලකා පිළිගැනීමට යොමු වෙයි. තෙවැනි පියවරේ දී පුද්ගලයා නුවණින් බුද්ධිමත් ව විමර්ශනශීලී ව ක්‍රියා කර යමක ඇති සැටිය යථාර්තය ප්‍රත්‍යක්‍ෂයක් වශයෙන් ක්‍ෂාත්සාත් කර ගනී. අනතුරු ව අන් අයට ද එය සත්‍යය සේ ප්‍රකාශ කරයි.

සත්‍යය සංකල්පය සම්බන්ධයෙන් පුළුල් පරීක්‍ෂණයක් කළ මහාචාර්ය කේ.එන්. ජයතිලක විද්වතා සත්‍යය සම්බන්ධ බෞද්ධ ආකල්පය ගැන පුළුල් ව කරුණු සාකච්ඡා කර ඇත. ඉන් අදහස් කීපයකට අවධානය යොමු කිරීම ප්‍රයෝජනවත් වනු ඇත. 'ආනුරූපත්‍යතාවාදය' නමින් සත්‍ය පිළිබඳ සංකල්පයක්, මතවාදයක් ඇත. මජ්ඣිම නිකායේ අපණ්ණක සූත්‍රය පරීක්‍ෂා කරන විට ආනුරූපත්‍යතා වාදයට සමාන ලක්‍ෂණ ඉන් විදහා දැක්වෙන බව එතුමා සඳහන් කරයි.[17] අපණ්ණක සූත්‍රයෙහි 'අසත්‍යය' යන්න නිර්වචන කර තිබෙන්නේ කරුණුවල නිශේදනයක් හෙවත් කරුණුවලට අනුරූප නො වීමක් යනුවෙනි. අසත්‍ය විශ්වාසයක්, අසත්‍ය සංකල්පනයක් හා අසත්‍ය ප්‍රකාශනයක් කෙබඳු ද යන්න මෙසේ නිර්වචනය කර ඇත. සකාරණ ව පරලොවක් තිබිය දී පරලොවක් නැතැයි යන විශ්වාසය තමා තුළ ඇතිවේ නම් එය අසත්‍ය විශ්වාසයකි. පරලොවක් නැතැයි යමකු සිතන්නේ නම් එය අසත්‍ය සිතිවිල්ලකි. සකාරණ ව පරලොවක් ඇති විට පරලොවක් නැතැයි යමකු කියන්නේ නම් එය අසත්‍ය ප්‍රකාශයකි.[18] (සන්තං යෙව බො පන පරං ලොකං, නත්‍ථි පරො ලොකොතිස්ස දිට්ඨි හොති. සාස්ස හොති මිච්ඡාදිට්ඨි, සන්තං යෙ ව බො පර ලොකං, නත්‍ථි පරො ලොකොතිස්ස දිට්ඨි හොති. සාස්ස හොති

මිච්ඡාදිට්ඨි, සන්තං යෙ ව බො පන පරං ලොකං, නත්ථි පරොලොකොති සංකප්පෙති, සවාස්ස හොති මිච්ඡාසංකප්පො.....නත්ථි පරොලොකොති වාචං භාසති සාස්ස හොති මිච්ඡා වාචා) මෙහි 'මිච්ඡා' යන වචනයෙන් ධ්වනිත වන්නේ අසත්‍යය යන අර්ථය යි. විශ්වාස වශයෙන් හෝ සංකල්පනයන් වශයෙන් හෝ ප්‍රකාශනයන් වශයෙන් පවත්නා ප්‍රස්තුතයන් ලෝකයේ කරුණු සමග නො ගැලපෙන විට-අනුරූප නො වන විට ඒ මගින් ලෝකයේ කරුණු නිශේධනය වන විට එවැනි විශ්වාස, සිතිවිලි, ප්‍රකාශ අසත්‍යය සේ සලකා ඇත.[19]

විශ්වාස, සිතිවිලි, ප්‍රකාශ යන මේ කවරක් හෝ ලෝකයේ පවතින වස්තු, සිද්ධි, පුද්ගල සංඛ්‍යාතයන් හා නො ගැලපෙන විට, එමගින් කරුණු තහවුරු වන විට සත්‍යය සේ සලකා ඇත. සත්‍ය යන අදහස දීමට භාවිත කොට තිබෙන්නේ 'සම්මා' යන පදය යි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා යනු උදාහරණ යි. 'සම්මා' යන්නෙහි පදගතාර්ථය 'නිවැරදි' යන්න වුවත් මෙහි දී අදහස් කර ඇත්තේ 'සත්‍යය' යන්න යි. කරුණු හා අනුරූප වීම ඇසුරින් සත්‍යය නිර්වචනය කර ඇතත් අනුසන්ධානය ද එහි නිර්ණායකයක් ලෙස සලකා තිබේ. ප්‍රකාශන දෙකක් එකිනෙකට විසංවාදී වන විට දෙක ම සත්‍ය විය නො හැකි බවත්, පෙන්වා දී ඇත.[20] නො යෙකුත් ගුරුකුල විසින් ඉදිරිපත් කරන ලද නො යෙකුත් මතවාද සැලකිල්ලට ගනිමින් සුත්ත නිපාතයේ දී මේ ප්‍රශ්නය නගා ඇත.[21] ''දක්ෂ බව කියන වාදශීලි අය නො යෙක් මත සත්‍යය ලෙස ප්‍රකාශ කරන්නේ මක් නිසා ද? ඒකාන්තයෙන් ම බොහෝ සත්‍ය වේ ද? එසේ නැතහොත් ඔවුහු තර්කය අනුව සිතත් ද?'' මෙයට පිළිතුරු වශයෙන් දක්වන අදහස මෙසේ ය. ''ලෝකයෙහි සංඥාව හැරුණු විට බොහෝ වූ නා නා සත්‍ය නැත'' මේ සන්දර්භය තුළ අවධාරණයෙන් ප්‍රකාශ කර ඇත්තේ සත්‍යය එකක් මිස දෙකක් නො මැති බව යි. ''දන්නා වූ ප්‍රජාව යම් සත්‍යයක් පිළිබඳ ව විවාදයට නො පැමිණේ ද, එබඳු සත්‍ය ඇත්තේ එකකි.''



කෙනෙකු කරන ප්‍රකාශයන් සංස්ථිතික වීම නැතහොත් අනුසන්ධාන වීම සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවල දී ශ්‍රමණ බ්‍රාහ්මණයන් සමග තර්ක කර පෙන්වා දී ඇත. ඔවුන්ගේ මත එකකට එකක් විසංවාදී මත නිසා ඒවා අසත්‍ය වන බව උන්වහන්සේ පෙන්වා දී ඇත. මෙහි ලා අදාළ නිදසුන් සච්චක සමග කළ වාදයේ තොරතුරු ඇතුළත් සච්චක සූත්‍රයෙන් ඉදිරිපත් කළ හැකි යි. එක්තරා අවස්ථාවක සච්චකගේ ප්‍රකාශයක් සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේ වදාරන්නේ ''ඔබගේ මුල් ප්‍රකාශන පසු ප්‍රකාශන හා නො ගැලපේ. පසු ප්‍රකාශන මුල් ප්‍රකාශන හා නො ගැලපේ''[22] යනුවෙනි. අදහසක්, මතයක්, පිළිගැනීමේ දී ඊට සම්බන්ධ ප්‍රකාශන අතර සංස්ථිතික බවක් හෙවත් අන්‍යෝන්‍ය අනුසන්ධානයක් පැවතිය යුතු බව ප්‍රකට කෙරෙ යි.

සත්‍යය පිළිබඳ බෞද්ධ ආකල්පය විමසීමේ දී සුත්තනිපාතයේ අට්ඨක වග්ගයේ සඳහන් වන 'පච්චේක සච්ච' සංකල්පය ද විමසා බැලීම වැදගත් වෙයි. මහාචාර්ය ජයතිලක මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන මතය මෙසේයි.[23] 'පච්චේක සච්ච' නමැති සංකල්පයක් ද මුල් බෞද්ධ ලේඛනවල දක්නට ලැබේ. එක්වරට ම පෙනෙන්නේ මේ සංකල්පය සත්‍යයේ පැවතිය යුතු සංස්ථිතික භාවය පිළිබඳ අදහසට එරෙහි ව යන බවකි. වාදයෙහි පැටලුණු විවිධ මතවාදීන් විසින් ඉදිරිපත් කරන ලද මතවාදවල විවිධත්වය ගැන සඳහන් කරන අවස්ථාවන්හි දී සුත්තනිපාතයේ මුල්වරට මෙම සංකල්පය හමුවේ. මේ පුද්ගලයන් ආධානග්‍රාහී ලෙස මෙම පෞද්ගලික සත්‍යයන්හි එල්බ සිටිතැයි එහි සඳහන් වේ. (පච්චේක සච්චෙසු පුථූ නිවිට්ඨා) 'පච්චේක' යන්නෙහි පදගතාර්ථය වන්නේ එක එකක් හෝ පෞද්ගලික යන්නයි. පෞද්ගලික ව කරුණු වශයෙන් ඉදිරිපත් කෙරෙන සත්‍යයන් ''ප්‍රත්‍යෙක සත්‍ය'' යන්නෙන් අදහස් කෙරෙන බව 'බුඩිස්ට් හයිබ්‍රිඩ් සංස්ක්‍රිට්' (BHS) ශබ්දකෝෂය සඳහන් කරයි. කෙනෙක් යමක් ප්‍රත්‍යක්ෂ කර එය සමස්තයට ම ගලපා ඉදං සච්චා හි නිවේසයෙන් යුතු ව අදහස් ප්‍රකාශ කිරීමේ දී දක්නට ලැබෙන්නේ මෙම ලක්ෂණයයි. මේ ස්වභාවය නිසා ඔවුනොවුන්

වචන නමැති ආයුධවලින් එකිනෙකාට පහර දෙමින් සිටින බව "මුඛසත්තීහි විතුදන්තා විහරන්ති" යනුවෙන් සූත්‍රාන්තයන්හි සඳහන් කර ඇත.[24]

'පච්චේකසච්ච' සංකල්පය විමසීමේ දී උදානපාළියේ සඳහන් ජාත්‍යන්ධයන් සහ ඇතා හඳුනා ගැනීමේ කථා පුවත විමසා බැලීම වැදගත් වේ.[25] සැවැත් නුවර රාජ්‍යය කළ එක්තරා රජෙකු ජාත්‍යන්ධයන් රැස්කරවා ඇතකුගේ ශරීරය අතගාන්නට සලස්වා උගේ හැටි කීමට එකී අන්ධයන්ට නියම කරයි. ඔවුහු තමා ස්පර්ශ කළ කොටස අනුව ඇතා මෙබඳු යැයි කියති. ඒ අනුව එකෙක් ඇතාගේ කකුල අතගා ඇතා වංගෙඩි කොටයක් වගේ යැයි කියයි. කණ අතගෑ එකෙක් ඇතා කුල්ලක් වැනි යැයි කියයි. මේ එක් එක් අන්ධයෙක් අතගෑ කොටස ඔහුට සත්‍යය සේ දැනුනත්, මුලු ඇතා ම මේ ආකාර යැයි සමස්තය සම්බන්ධයෙන් නිගමනයකට එළඹීම අසත්‍යයි; වැරදි සහගතයි. ජාත්‍යන්ධයන්ගේ විස්තර කිරීම ගැලපෙන්නේ ඔවුන් ස්පර්ශ කළ කොටසට අනුව පමණකි. විවිධ මහණ බමුණන් විසින් ගෙනහැර දක්වන ලද අව්‍යාකත මතවාදවල තත්ත්වය ද බෙහෙවින් මීට සමාන බව පෙන්වා දී ඇත.[26] ඇතාගේ ඒ ඒ අංග ස්පර්ශ කළ අන්ධයෝ තමාගේ ප්‍රත්‍යක්ෂයට අනුව ඇතාගේ ස්වභාවය, ස්වරූපය ප්‍රකාශ කිරීමේ දී ඒකමතික නොවී නානාමතික වන බව පැහැදිලිය. සමස්තයක් වශයෙන් ඇතාගේ හැඩරුව කිසිවෙකුගෙන් ප්‍රකාශ නොවේ. යථාභූතය ප්‍රකාශ නොවේ. ඔවුන් ප්‍රකාශ කරන අදහස්වල යම් සත්‍යයක් තිබේ නම් එය ඒක පාර්ශවීය වූවක් වේ. කාටත් පිළිගත හැකි සත්‍යයක් නොවේ. ග්‍රහණය වන සීමාවට පමණක් ඔවුන්ගේ දැනුම සීමා වන නිසා යථාභූතයේ යම් කොටසක් පමණක් ඉන් ප්‍රකාශ වේ.

සත්‍යය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් කවරේදැයි පරීක්ෂා කිරීමේදී සුතත නිපාතයේ අට්ඨකවග්ග සූත්‍රාගත ඉගැන්වීම් ඉතා වැදගත් වේ. මෙහි දෘෂ්ඨි පිළිබඳ කෙරෙන විග්‍රහයට අදාළව සත්‍යය පිළිබඳ ප්‍රශ්නය ද මතුකර ඇත. මේ සම්බන්ධයෙන් පිරික්සීමක යෙදෙන සේවාර්ජිත මහාචාර්ය පී.ඩී. ප්‍රේමසිරි



16 OCT 2017

වැදගත් අදහස් කීපයක් ඉදිරිපත් කර ඇත. ඒවා ද මෙහිදී සැලකිල්ලට ගැනේ.

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් අතර ආර්ය සත්‍යය යනුවෙන් පිළිගන්නා ලද සත්‍යය ඇත. බුදුදහම විශ්වය හා පුද්ගලයා පිළිබඳ පරම යතාර්ථයක් වශයෙන් සත්භාවවාදී අර්ථයෙන් බ්‍රහ්මන්, ඊශ්වර, ආත්මන්, පුරුෂ ආදි සංකල්ප ඉදිරිපත් කිරීමෙන් වැළකුණු බව පැහැදිලිය. බුදුසමය විසින් පිළිගන්නා ලද්දේ එබඳු අධිභෞතික වූ සත්‍යය නොව, මිනිස් ජීවිතයේ පරම යහපත හා සම්බන්ධ වූ ප්‍රත්‍යක්ෂගෝචර වූ ප්‍රායෝගිකත්වයෙන් යුතු ආර්ය සත්‍යයයි. එබැවින් විවාදය සඳහා හේතු භූත වන ආධානග්‍රාහී දෘෂ්ඨී බුදුසමයෙහි සත්‍යය වශයෙන් පිළිගැනීමක් නැත.[27]

බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙහි අරමුණ වූයේ ලෝකය පිළිබඳ පරම සත් ස්වභාවය කුමක් ද? එය ඒකත්වයක් ද, බහුත්වයක් ද, ද්‍රව්‍ය පදාර්ථයක් ද, විඥාන පදාර්ථයක් ද, ඊශ්වර ද, බ්‍රහ්ම ද යනාදි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම නොවේ.[28] ඒ ආකාරයේ පිළිතුරු සැපයීම නිසා සිදුවන්නේ යම්කිසි සංඥාවක් ග්‍රහණය කිරීමක් බව බුදුරජාණන් වහන්සේ සැලකූහ. බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙහි කිසිදු අනුමාත්‍ර වූ හෝ සංඥාවක් දක්නට නැති හෙයින්, මාගන්දිය බමුණා එය මුළාවූවන්ගේ නැතහොත් සංශයවාදීන්ගේ ඉගැන්වීම හා සමාන බව සැලකූ අයුරු මාගන්දිය සූත්‍රයෙහි සඳහන් වෙයි.[29] ඒ ඒ පුද්ගලයන් විසින් විවිධ සංඥා ග්‍රහණය කෙරෙමින් පරම සද්භාවය පිළිබඳ විනිශ්චය කෙරෙන හෙයින් පරම සත්‍යය පිළිබඳ විවිධ මත බිහිවන බව අට්ඨක වග්ගයෙන් ප්‍රකාශ වෙයි. දෘෂ්ටිග්‍රාහි පුද්ගලයන් විසින් සිදු කෙරෙන්නේ තම තමාගේ තීරණය මත තම තමාගේ දෘෂ්ටිය, සත්‍යය බවට පත් කිරීමේ ව්‍යායාමයකි.[30] ඒවා පච්චෙතසච්ච යනුවෙන් හඳුන්වා ඇත්තේ ද එම සත්‍යයන්හි ඇති ආත්මීය බව හැඟවීම පිණිසය. සංඥා ග්‍රහණය කිරීමෙන් තොරව බහුවිධ වූ සත්‍යය ඇතිවිය නොහැකි බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙති.[31]

16 OCT 2017



මේ අනුව බුදුසමය සත්‍යය පිළිබඳව දරන්නේ පරම සත්වාදි ස්ථාවර සියල්ල ප්‍රතික්ෂේප කිරීමට තුඩු දෙන ආකල්පයක් බව පැහැදිලි වෙයි. එවැනි මතවාද ප්‍රතික්ෂේප කරන බුදුදහම, සත්‍යය පිළිබඳ උපයෝගීතාවාදී ආකල්පය අනුව බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දෙනු ලැබුවේ මිනිසුන් අතර සියලු වාද විවාද අවසන් කර සියලු දුක් නිවීමට පමුණුවන සත්‍යයක් ඇති බවයි. එනම් නිබ්බාන හෙවත් නිරෝධ සත්‍යයයි. එය අවබෝධ කළ විට විවාදයක් නැත. ප්‍රජාවගේ විවාදයට එළඹීමේ නැඹුරුව නැති කරන එකම සත්‍යය ද එය වෙයි.[32]

බුදුදහමෙහි සත්‍යය පිළිබඳ ආකල්ප විමසීමේ දී මධ්‍යම ප්‍රතිපදාව, මධ්‍යම මාර්ගය, අන්තගාමී නො වීම සම්බන්ධයෙන් ද විමසා බැලීම අවශ්‍ය ය.

සබ්බං අත්ථි - සබ්බං නත්ථි
සස්සත - උච්ඡේද
කාමසුඛල්ලිකානුයොග - අත්තකිලමතානුයොග
තංජීවං තං සරීරං - අඤ්ඤංජීවං අඤ්ඤං සරීරං

ආදී ඉගැන්වීම් සියල්ල ම අන්ත වන අතර මේ අන්තවලට නොවැටී මධ්‍ය තත්ත්වයක හිඳිමින් උන්වහන්සේ ධර්ම දේශනා කරනා බව (එතෙ තෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන.... ධම්මං දෙසෙති) මින් පැහැදිලි වන්නේ අන්ත දෙක අතර පිහිටි මධ්‍යය තත්ත්වය සත්‍යය වන බව පිළිගෙන ඇත. පරමාර්ථ සත්‍යය වූ නිවන් අවබෝධයට මාර්ගය වශයෙන් 'මජ්ඣිමා පටිපදා' පෙන්වා දීමෙන් ද පැහැදිලි වන්නේ 'මධ්‍යම' ලක්ෂණය ස්වභාවය සත්‍යය ලෙස පිළිගෙන ඇති ආකාරය යි.

අටුවා යුගය වන විට සත්‍යය ද්වයක් පිළිබඳ සංකල්පයක් වර්ධනය වී තිබෙන බව කථාවත්ථු අටුවාවෙහි සහ අංගුත්තර අටුවාවේ සඳහන් පහත ගාථාවන්ගෙන් තහවුරු වේ.

දුවෙ සච්චානි අක්ඛාසි සම්බුද්ධොවදතං වරො
සම්මුතිං පරමත්ථංච තතියං නූපලබ්භති
සංකෙත වචනං සච්චං ලොකසම්මුති කාරණං
පරමත්ථ වචනං සච්චං ධම්මානං තථලක්ඛණං[33]



උසස් ම ආචාර්යවරයා වූ බුදුරජාණන් වහන්සේ සත්‍යය දෙකක් දේශනා කරති. සම්මුති සත්‍යය හා පරමාර්ථ සත්‍යය වශයෙනි. මේ අනුව තෙවැනි සත්‍යයකට අවකාශ නැත. ලෝක සම්මුතිය එසේ බැවින් සම්මුති ප්‍රකාශයක් සත්‍යය වේ. ලෝකයේ පවත්නා දේවල, ධර්මතාවන්හි සැඟ වී පවත්නා ඇති සැටි ය, සැබෑ ලක්ෂණයන් එළිදරවු කරන බැවින් පරමාර්ථ ප්‍රකාශයන් ද සත්‍යය වේ. පිටක සාහිත්‍යයේ විශේෂයෙන් නිකාය ග්‍රන්ථ හෙවත් සූත්‍ර ධර්ම පරීක්‍ෂා කිරීමේ දී මෙවැනි ද්විභේදයක් දක්නට නො ලැබේ. එයට හේතු වන්නට ඇත්තේ ''ඒකංහි සච්චං න දුතියමත්ථි'' වැනි පැරණි පිළිගැනීම් විය හැකි ය. ස්කන්ධ, ධාතු වශයෙන් සත්ත්වයා ගැන කතා කරන විට සත්ත්ව, පුද්ගල ව්‍යවහාරයට ප්‍රමුඛත්වයක් නො ලැබේ. එය ද සත්‍යය යි. ඒ අනුව මෙම ද්විභේදය අටුවා යුගයේ දී දියුණුවන්නට ඇතැයි සිතිය හැකි යි.

## ආන්තික සටහන්

1. ''නිබ්බාන මග්ග විරතී
   සපතෙ සච්චභාසිතෙ
   තච්ඡෙ(චා)රිය සච්චමහි
   දිට්ඨීයං සච්චමීරිතං''
2. බුදුදහමෙහි දාර්ශනික ප්‍රස්තුත, ඉත්තෑපාන ධම්මාලංකාර හිමි, ශ්‍රී දේවි ප්‍රකාශන, දෙහිවල, 1997, 18 පිටුවේ සිට.
3. සංයුක්තනිකාය V (2) බුද්ධජයන්ති මුද්‍රණය, කොළඹ, 1987, ධම්මචක්කපවත්තන සූත්තං 270-225 පිටු.
4. විසුද්ධිමග්ග, පොල්වත්තේ බුද්ධදත්ත සංස්කරණය, සද්ධර්ම ප්‍රකාශ මුද්‍රණාලය, අලුත්ගම, 1914. ''යසමා පනෙතානි බුද්ධයො අරියා පටිවිජ්ඣන්ති තස්මා අරිය සච්චනීති වුච්චන්තීතිපි අරියසච්චානි.... අපිච අරියස්ස සච්චනීති පි අරියසච්චානි.... අපිච බො පන අරියානි සච්චනීතිපි අරියසච්චානි, අරියානීති තථානි අවිතථානි අවිසංවාදකානීති අත්ථො...., 384 පිටුව.
5. විසුද්ධිමග්ග, 384 පිටුව.
6. සං.නි. V (2), 234 පිටුව.
7. සං.නි. II, නිදාන සංයුක්ත, බුද්ධජයන්ති මුද්‍රණය, 1962, 40 පිටුව.

8. විසුද්ධිමග්ග, ''ඉධායං සච්චසද්දො අනෙකෙසු අත්ථෙසු දිස්සති, සෙය්‍යථීදං සච්චං භණෙ නකුජ්ඣෙය්‍යා'' ති ආදිසු වාචාසච්චෙ ''සච්චෙ ඨිතා සමණ බ්‍රාහ්මණාචා'' ති ආදිසු විරතිසච්චෙ, ''කසමානු සච්චානි වදන්ති නානා කුසලා වදානා'' ති ආදිසු ''දිට්ඨිසච්චෙ; ''එකංහි සච්චාං න දුතියමත්ථි ආදිසු'' පරමත්ථසච්චෙ, නිබ්බාණෙ චේව මග්ගෙච; චතුන්නං අරිය සච්චනා කතිකුසලානි ආදිසු අරියසච්චෙ....'' 385 පිටුව.
9. දීඝනිකාය I, බුද්ධජයන්ති මුද්‍රණය, 1982, 110 පිටුව.
10. මුල්බුදුසමයේ ඥාන විභාගය, කේ.එන්. ජයතිලක, සිංහල පරිවර්තනය හේ.මු. තිලකරත්න, ගොඩගේ සමාගම, කොළඹ, 550-552 පිටු බලන්න.
11. මජ්ඣිමනිකාය II, බුද්ධජයන්ති මුද්‍රණය, 1978, 92-93 පිටු.
12. සුත්තනිපාත - 452 ගාථාව ''පියවාචමෙව භාසෙය්‍ය''
13. ම.නි. II, 646-668 පිටු.
14. ''සද්ධා චෙපි භාරදවාජ පුරිසස්සහොති එවං මෙ සද්ධාති ඉතිං වදං සච්චමනුරක්ඛති, නත්වෙව තාව එකංසෙන නිට්ඨං ඉදමෙවසච්චං මොඝමඤ්ඤනති. එත්තාවතා ඛො භාරද්වාජ සච්චානු රක්ඛතා හොති.... යතො නං සමන්නේන සමානො විසුද්ධං ලොභනීයෙහි ධම්මෙහි සමනුපස්සති... විසුද්ධං දොසනීයෙහි ධම්මෙහි සමනුපස්සති... විසුද්ධං මොහනීයෙහි ධම්මෙහි සමනුපස්සති. අථ තසම්ං සද්ධං නිවෙසෙති.... පහිතතෙතා සමානො කායෙනචෙව පරම සච්චං සච්ඡිකරොති, පඤ්ඤයච නං අතිවිජ්ඣ පස්සති. එත්තාවතො ඛො භාරද්වාජ සච්චානුබොධො හොති.... නත්වෙව තාව සච්චානුපත්ති හොතීති. තෙසං යෙව භාරද්වාජ ධම්මානං ආසෙවනා භාවනා බහුලීකම්මා සච්චානුපත්ති හොති'' (චංකී සුත්තං - 640-662).
15. -එම.
16. -එම.
17. මුල්බුදුසමයේ ඥාන විභාගය, 553 පිටුව.
18. ම.නි. II, අප්පණ්ණකසුත්තං, 108-128 පිටු.
19. මුල්බුදුසමයේ ඥාන විභාගය, -553 පිටුව.
20. එම 554 පිටුව.
21. සුත්තනිපාත - බුද්ධජයන්ති මුද්‍රණය, 888, 889, 890 ගාථා බලන්න. PTS 884, 85, 86 ගාථා.
22. මජ්ඣිමනිකාය I, බුද්ධජයන්ති මුද්‍රණය, 1964.

''මනසි කරොහි අගනිවෙස්සන, මනසිකරිත්වා ඛො අග්ගිවෙස්සන, ඛ්‍යාකරොහි, නඛො තෙ සන්ධියති පුරිමෙනවා පච්ඡිමං, පච්ඡිමෙනවා පුරිමං'' චූලසච්චක සුත්තං - 550 පිටුව.



23. මුල්බුදුසමයේ ඥාන විභාගය, -556 පිටුව.
24. උදානපාලි, බුද්ධජයන්ති මුද්‍රණය, 1960.

''තෙ භණ්ඩනජාතා කලහජාතං විවාදාපන්නා අඤ්ඤමඤ්ඤ මුඛසත්තීහි විතුදන්තා විහරන්ති, එදිසො ධම්මො නෙදිසො ධම්මො, නෙදිසොධ මේවා එදිසො ධම්මොති'' 260 පිටුව.

25. එම 260 පිටුව.
26. උදානපාලි, ''එවමෙව ඛො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අන්ධා අචක්ඛුකා නෙදිසො ධම්මො එදිසො ධම්මොති....'' 262 පිටුව.
27. සුත්තනිපාතය, බුද්ධජයන්ති මුද්‍රණය, 1977, කොළඹ, 266 පිටුව.

''සච්චනති සො බ්‍රහ්මණො කිංවදෙය්‍ය
මුසතිවා සො විවදෙථකෙත
යස්මිං සමං විසමං චාපිනත්ථි
ස කෙත වාදං පටිසංයුජෙය්‍ය'' (847 ගාථාව).

28. සුත්ත නිපාතය - සිංහල පරිවර්තනය, පී.ඩී. ප්‍රේමසිරි, බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, මහනුවර, 2010, 56 පිටුව.
29. සු.නි. ''දිට්ඨිඤ්ච නිස්සාය අනුපුච්ඡමානො
සමුග්ගහීතොසු පමොහමාග
ඉතොච නාද්දක්ඛි අනුම්පි සඤ්ඤං
තසමා කුචං මොමුහතො දහාසි'' (845 ගාථාව).
30. සුත්ත නිපාතයේ බුද්ධ ජයන්ති මුද්‍රණාලයේ චූලවියුහ සූත්‍රයේ 886-890 ගාථා බලන්න.
31. සු.නි. ''නහෙච සච්චානි බහූනි නානා - අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකො'' (890)
-එම- ප්‍රේමසිරි සිංහල පරිවර්තනය බලන්න.
32. සුත්ත නිපාතය, ප්‍රේමසිරි සිංහල පරිවර්තනය, 57 පිටුව.
33. අඞ්ගුත්තරනිකායට්ඨකථා I, හේවාවිතාරණ මුද්‍රණය, 1923, කොළඹ, 54 පිටුව බලන්න.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. දීඝනිකාය, බුද්ධජයන්ති මුද්‍රණය.
2. මජ්ඣිමනිකාය, බුද්ධජයන්ති මුද්‍රණය.
3. සංයුක්තනිකාය, බුද්ධජයන්ති මුද්‍රණය.
4. අංගුත්තරනිකාය, බුද්ධජයන්ති මුද්‍රණය.
5. ඛුද්දකනිකාය, බුද්ධජයන්ති මුද්‍රණය.
6. විසුද්ධිමග්ග - බුද්ධදත්ත සංස්කරණය, 1934 අළුත්ගම.
7. අඞගුත්තරනිකායට්ඨකථා I, හේවාවිතාරණ මුද්‍රණය, 1923, කොළඹ.
8. මුල්බුදු සමයේ ඥාන විභාගය, කේ.එන්. ජයතිලක, සිංහල පරිවර්තනය හේ.මු. තිලකරත්න, ගොඩගේ සමාගම, 2003, කොළඹ.
9. බුදු දහමෙහි දාර්ශනික ප්‍රස්තුත, ඉත්තෑපාන ධම්මාලංකාර හිමි, ශ්‍රී දේවි ප්‍රකාශන, දෙහිවල, 1997.
10. සුත්ත නිපාතය - සිංහල පරිවර්තනය, පී.ඩී. ප්‍රේමසිරි, බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, මහනුවර, 2010.
11. ENCYLOPAEIA OF BUDDHISM, VOLUME, VII, FASCICLE 3 "SACCA" BY ASANGA TILAKARATNE, PP. 584-589
12. FACETS OF BUDDHIST THOUGHT COLLECTED ESSAYS, K.N. JAYATILEKE, BPS. SOCIETY, KANDY, 2009.